සිංහල ප්‍රබන්ධ කථා ඇගයීමෙහි ලා පේරාදෙණි සාහිත්‍ය කතිකාව තුළ පැවැති විනිශ්චයේ ස්වභාවය පිළිබඳ අධ්‍යයනයක්

C. Ranasinha

Abstract

This research aims to identify and examine the theoretical approach of evaluation in Peradeniya literary discourse for modern Sinhala novels and remarks on the writers who have been excluded from the discourse and excluded by it. To order to do that, examine the works of E.R. Sarathchandra (1914-1996), Modern Sinhalese Fiction (1943) and its Sinhala translation "*Sinhala Nawakatha Ithihasaya Ha Wicharaya"* (1951) and other selected writings of Sarathchandra Wickramasuriya, Ariya Rajakaruna who were close members of the Peradeniya school were examined. The research problem here is to identify and examine the nature of reading by Peradeniya critics regarding Sinhalese novels. The theoretical approach for the research is the two concepts of Michel Foucault (1926-1984), a philosopher and historian who has studied history and other related areas, which are excluding and including. The result of the research shows that Peradeniya literary discourse has appreciated, valued, and included selected works that have been attributed some literary qualities and excluded others from their discourse. The Student concludes that Peradeniya Literary Discourse has included the selected Sinhala writers and excluded the others.

Keywords : The Peradeniya literary discourse, Including, Excluding, Criterias for literary criticism.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 30

1. හැඳින්වීම

19 වන සියවසේ අග භාගයේ හා 20 වන සියවසේ මුල් භාගයේ ඇති වූ සමාජ, දේශපාලනික හා සංස්කෘතික විපර්යාසවල ප්‍රතිඵලයක් වශයෙන් සිංහල ප්‍රබන්ධ සාහිත්‍යය ගොඩනැගුණු ආකාරය නිරීක්ෂණය කළ හැකි ය. ආරම්භයේ දී පරිවර්තන, අනුවර්තන හා විවිධාකාර ප්‍රවර්ගයන් නියෝජනය කරන්නා වූ ගද්‍ය නිර්මාණ බිහි වූ අතර, ක්‍රමයෙන් එය වඩා සාහිත්‍යමය ගුණාංගවලින් සමන්විත සාහිත්‍යයක් බවට පත් වූ ආකාරය විචාරකයෝ පෙන්වා දෙති.[1]

පුවත්පත, සඟරාව බිහිවී ව්‍යාප්ත වීම ජාතික ව්‍යාපාරය, අමද්‍යප ව්‍යාපාරය මෙන් ම ක්‍රිස්තියානි මතවාදී ව්‍යාප්තියට එරෙහි ව බෞද්ධ පුනරුද ව්‍යාපාරය ගොඩනැගීමට සමාන්තර ව සිංහල ගද්‍ය ප්‍රබන්ධය ක්‍රමික ව වර්ධනය විය. සයිමන් ද සිල්වා (1874-1920), ඇල්බට් ද සිල්වා (1866-1919), අයිසෙක් ද සිල්වා (1844-1907) සහ පියදාස සිරිසේන (1875-1946) ආදීන් විසින් මුල් යුගයේ දී සිංහල ගද්‍ය සාහිත්‍යයට පදනම දැමූ අතර ඩබ්ලිව්. ඒ. සිල්වා (1891-1957) එය පොදු පාඨක ලෝකය තුළ වඩාත් ජනප්‍රිය කරවී ය. මාර්ටින් වික්‍රමසිංහ (1890-1976) එහි ගමන් මග යථාර්ථවාදී ප්‍රවේශයක් වෙතට යොමු කරවී ය. නූතන සිංහල ප්‍රබන්ධ සාහිත්‍යයේ ප්‍රථම යථාර්ථවාදී නවකථාව ලෙස සැලකෙන 'ගම්පෙරළිය' මුල්වරට ප්‍රකාශයට පත් වී තිබෙන්නේ 1944 දී ය. ඉන් පසු ව 50 හා 60 දශකවල දී වඩා නූතනවාදී නවකතාකරුවන් ලෙස සැලකෙන ගුණදාස අමරසේකර, සිරි ගුනසිංහ, සිරි තිලකසිරි සිරිල් බී. පෙරේරා, කේ. ජයතිලක ඊවා රණවීර එදිරිවීර සරච්චන්ද්‍ර, හේමරත්න ලියනාරච්චි ප්‍රමුඛ නවකථාකරුවන් විශාල සංඛ්‍යාවක් සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයට පිවිසි අතර, නූතන සිංහල නවකථාව, වස්තුවිෂය, චරිත නිරූපණය හා භාෂා භාවිතය යනාදී මූලික සාධකවලින් සැලකිය යුතු ප්‍රවර්ධනයක් අත්පත් කරගත් බව පෙන්වා දිය හැකි ය. නූතන සිංහල සාහිත්‍යය පිළිබඳ ප්‍රථම වරට පළ වූ ශාස්ත්‍රීය විමර්ශනයක් ලෙස සැලකෙන්නේ එදිරිවීර සරච්චන්ද්‍රගේ 'Modern Sinhalese Fiction' (1946) නම් ඉංග්‍රීසි භාෂාවෙන් පළ වූ කෘතිය යි. මෙය 1950 දී 'Sinhalese Novel' යන නමින් පළ වූ අතර, 1951 දී 'සිංහල නවකතා ඉතිහාසය හා විචාරය' යන නමින් සිංහලට පරිවර්තනය කොට පළ කෙරුණි. සරච්චන්ද්‍ර තම කෘතිය පළ කිරීමට පෙර 1924 දී මාර්ටින් වික්‍රමසිංහ තම 'ගැහැනියක්' කෙටිකතා සංග්‍රහයේ හැඳින්වීම මගින් බටහිර හා රුසියානු සාහිත්‍යය පිළිබඳ සාකච්ඡාවක් නිර්මාණය කර තිබූ අතර 1946 දී පළවූ නවකථා කලාව ග්‍රන්ථය මගින් ජී. බී. සේනානායක ද එම විෂය ප්‍රදේශ පිළිබඳ තියුණු විමර්ශනයක නිරත ව සිටියේ ය.

JOURNAL OF THE FACULTY OF HUMANITIES-30

[1].මේ යුගය හා එම යුගයේ ප්‍රබන්ධවල ස්වභාවයත්, ප්‍රබන්ධකරුවන්ගේ පසුබිමත් පිළිබඳ දීර්ඝ විවරණාත්මක පර්යේෂණ රැසක් සිදු කෙරී තිබේ. උදාහරණ කිහිපයක් මෙසේ යඃ

තොම්සන් ඒ, වැන්දබෝනා., (1997). *සිංහල නවකතාවේ ආදිතමයෝ.* කොළඹ. සූරිය ප්‍රකාශකයෝ.

සරච්චන්ද්‍ර, වික්‍රමසූරිය., (1970). *සිංහල නවකතාවට මගපෑදීම.* මහනුවර. සරසවි මුද්‍රණාලය.

ආරිය, රාජකරුණා., (2003). *සිංහල නවකතාවේ ආරම්භය.* කොළඹ. ඇස්. ගොඩගේ.

19 වන සියවසේ සිංහල ගද්‍ය සාහිත්‍ය. කොළඹ. ප්‍රදීප ප්‍රකාශකයෝ.

උදය ප්‍රශාන්ත, මැද්දේගම., (1999). *සියවසක සිංහල නවකතා.* කොළඹ. ඇස්. ගොඩගේ.

මුල්ලපිටියේ, කේ.එච්. ද සිල්වා., (1966). *සිංහල නවකතාවේ පුරෝගාමියා.* කොළඹ. ශ්‍රී ලංකා ප්‍රකාශක සමාගම.

එදිරිවීර, සරච්චන්ද්‍ර., (2011). *සිංහල නවකතා ඉතිහාසය හා විචාරය.* නුගේගොඩ. සරසවි ප්‍රකාශකයෝ.

එනමුත් සරච්චන්ද්‍රගේ ප්‍රයත්නය එවැනි සාකච්ඡාවක් ගොඩනැඟීම නොව, නූතන සිංහල ගද්‍ය ප්‍රබන්ධ විෂයයක් වශයෙන් තෝරා ගනිමින් විමර්ශනයට ලක් කිරීම යි. එනිසා එම කෘතිය නූතන සිංහල සාහිත්‍ය විචාරයේ පුරෝගාමී කෘතිය ලෙස සැලකීමට සිදුවෙයි.

2. සාහිත්‍ය විමර්ශනය

මෙම ලිපියේ දී සාහිත්‍ය විමර්ශනය යටතේ ප්‍රාථමික මූලාශ්‍රය ලෙස අධ්‍යයනයට ලක් කෙරෙන්නේ පේරාදෙණි විචාර කතිකාව නිර්මාණය කිරීමෙහි ලා මූලික පදනම සැපයූ එදිරිවීර සරච්චන්ද්‍රගේ 'සිංහල නවකථා ඉතිහාසය හා විචාරය' කෘතිය යි. ඊට අමතර ව ප්‍රාථමික මූලාශ්‍රය ලෙස එම සිංහල කෘතියට පෙර එහි ම ඉංග්‍රීසි මුල් මුද්‍රණය ලෙස ලියැවුණු 'Modern Sinhalese Fiction' (1946) සහ 'Sinhalese Novel' (1950) කෘති සලකා බැලේ. ද්විතීයික මූලාශ්‍රය ලෙස එම කෘතියට පරිබාහිර ව ලියවුණු පේරාදෙණි විචාර කතිකාව පෝෂණය කළ පතපොත හා විචාර ලිපි ලේඛන සැලකේ. එමෙන් ම මෙහි දී අවධානයට ලක් වන සාහිත්‍ය නිර්මාණ ද සැලකේ.

3. පර්යේෂණ ක්‍රමවේදය

මේ ලිපියේ ක්‍රමවේදය ලබා ගැනෙන්නේ මිචෙල් ෆූකෝ (1926-1984) නම් ප්‍රංශ දාර්ශනිකයාගෙනි. ෆූකෝ බෙහෙවින් ප්‍රකට ව ඇත්තේ පශ්චාත් නූතනවාදී දාර්ශනික ප්‍රවණතාව නියෝජනය කරන දාර්ශනියකු හා ඉතිහාසඥයකු වශයෙනි. මෙහි දී ඉංග්‍රීසි හා සිංහල යන දෙබසින් ම ෆූකෝගේ දර්ශනය හා පර්යේෂණ විධික්‍රම (Research Methodology) පිළිබඳ ජයදේව උයන්ගොඩ හා ඩෙස්මන් මල්ලිකාරච්චි ලියූ ලිපි ලේඛන උපයෝගී කර ගතිමි. මෙම ශාස්ත්‍රඥයන් දෙදෙනා ම පෙන්වා දෙන ආකාරයට ෆූකෝගේ විධික්‍රමය බෙහෙවින් ම බලය ඥාන ගවේෂණය යන සාධක දෙක අතර පවතින අන්තර් සම්බන්ධය විධාරණය කරයි.[2] ෆූකෝගේ විධික්‍රමය ගැන සාකච්ඡා කරන උයන්ගොඩ පෙන්වා දෙන්නේ විද්‍යාත්මක ඥානය / ශාස්ත්‍රීය ඥානය බල සබඳතා තුළට කාවැදී ඇති ආකාරයත්, දැනුම නිෂ්පාදනය බලය සඳහා සහ බලය රැක ගැනීම සඳහා භාවිත වන ආකාරයත් පිළිබඳ ව ය.[3]

JOURNAL OF THE FACULTY OF HUMANITIES 30

---

[2].ඩෙස්මන්, මල්ලිකාරච්චි., (2003). *සමාජ හා මානව විද්‍යාත්මක ලිපි.* කර්තෘ ප්‍රකාශන. පි. 20 හා ජයදේව, උයන්ගොඩ., *මිචෙල් ෆූකෝගේ විධික්‍රමය කෙටි හැඳින්වීමක්.* ලංකාවේ නව ප්‍රතිජාතික චින්තනයේ දසවසක්. (සංස්.) නිර්මාල් රංජිත් දේවසිරි, දෙවන වෙළුම (1992-1997). (2021). කළුබෝවිල. විදර්ශන ප්‍රකාශන.පි. 331-338.

[3].ජයදේව, උයන්ගොඩ., (2010). *සමාජීය-මානවීය විද්‍යා පර්යේෂණ - දාර්ශනික සහ ක්‍රමවේදී හැඳින්වීමක්.* කොළඹ. සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.
Jayadewa, Uyangoda., (2017). *Social Research Philsophical and Methodological Foundations.* Social Scienties Association - Colombo, p. 274.

ෆූකෝ තම ක්‍රමවේදය මාක්ස්වාදී ක්‍රමවේදයෙන් මුළුමනින් ම ඉවතට යමින් ගොඩනගන අතර, මාක්ස්වාදී ඥාන විභාගයේ දී අවධාරණය කළ රාජ්‍ය මගින් ඇති කරන බලය කෙරෙහි නොව, රාජ්‍ය නොවන බල ව්‍යූහ - එනම්, දැනුම, කතිකාමය අවකාශ විවිධ සංවාද මගින් ගොඩනැගෙන දැනුම මත නිර්මාණය කළ ආකාරය ෆූකෝගේ මුල් පොත උපයෝගී කොටගනිමින් උයන්ගොඩ පෙන්වා දෙයි.[4] ෆූකෝ ඉතිහාසකරණය පිළිබඳ දැරූ අදහස් උයන්ගොඩ මෙසේ සාරාංශ කරයි.

ඉතිහාසකරණය යනු ඓතිහාසික සිදුවීම් පිළිබඳ වෘතාන්ත ලිවීමක් නොවේ. මනුෂ්‍යයන් පිළිබඳ වෘතාන්ත ලිවීමක් ද නොවේ. ඥානය සහ බලය පිළිබඳ ව්‍යූහයන් හා ජාලයන්ට මැදි වූ මනුෂ්‍යයන් විෂයීයන් (Subject) බවට නිර්මාණය කරන ලද ඥාන රාමු සහ කතිකා අනාවරණය කර ගැනීම යි.[5] මෙම අර්ථයෙන් ගත් කල ෆූකෝගේ විධික්‍රමය මෙම පර්යේෂණ ලිපිය සඳහා උචිත න්‍යායාත්මක පදනමක් සපයයි. මන්ද යත් පේරාදෙණි සාහිත්‍ය විචාර ක්‍රියාවලිය නමැති කතිකාව (Discourse) විසින් නිර්මාණය කරන ලද ඥාන රාමු හා කතිකාමය ස්වභාවය හඳුනාගැනීමත් එම කතිකාව මගින් ඇතුළත් කර ගන්නා ලද හා බැහැර කරගන්නා ලද කෘති සහ කතුවරයන් හඳුනාගැනීමටත් ෆූකෝ ගේ මෙම විධික්‍රමය සප්‍රයෝජනවත් වන බැවිනි. ෆූකෝගේ කතිකාව / සංවාද භාෂාව / සංකථනය පිළිබඳ සංකල්පය ෆූකෝ ලියූ 'The Order of Things' හා 'The Archaeology of Knowledge' යන කෘති උපයෝගී කොටගනිමින් සාකච්ඡා කරන උයන්ගොඩ පෙන්වා දෙන්නේ "සංවාද භාෂාව යනු නොයෙකුත් නිශ්චිත අරමුණු සඳහා භාෂාව නිශ්චය තලයක සිට මෙහෙයවා ගැනීම" යි යන්න ෆූකෝගේ ඉතිහාස අධ්‍යයන විධික්‍රමයේ කේන්ද්‍රීය සංකල්පය බවයි. එම සංකල්පයේ ස්වභාවය තවදුරටත් විග්‍රහ කරමින් ඔහු පෙන්වා දෙන්නේ "දැනුම පිළිබඳ ඉතිහාසයක් වූ කලි විවිධ සංවාද භාෂාවන් ඇතිවීම, නැතිවීම, අලුත් ඒවා ඉපදීම, ඒවා විසින් න්‍යායයන්, සංකල්ප සහ චින්තන පද්ධතීන් බිහිකරනු ලැබීම යනාදියේ ඉතිහාසයක් බවයි."[6] නූතන සිංහල සාහිත්‍ය විචාර කතිකාවේ/සංවාද භාෂාවේ පේරාදෙණි විචාර කතිකාව පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී යථෝක්ත න්‍යායාත්මක එළඹුම් මැනවින් යොදා ගැනීමේ හැකියාව පවතී. මන්ද යත් පේරාදෙණි විචාර කතිකාව තුළ ෆූකෝ පෙන්වා දෙන එම සංකල්ප නිශ්චිත ආකාරයෙන් ක්‍රියාත්මක වූ බව නිරීක්ෂණය කළ හැකි බැවිනි. තව ද ග්‍රන්ථ අර්ථ නිරූපණය පිළිබඳ සාකච්ඡාවක නිරත වෙමින් පී. බී. මීගස්කුඹුර පෙන්වා දෙන්නේ "ඕනෑ ම ග්‍රන්ථයක් අර්ථ නිරූපණය කිරීමේ දී නිශ්චිත කථකයකු නිශ්චිත කතිකාවක් සමග සම්බන්ධ කෙරේ. එහි දී අසුවල් කථකයා අසුවල් ප්‍රකරණයේ දී කළ මෙම ප්‍රකාශයෙන් ගම්‍ය විය යුත්තේ මේ විය යුතු යයි අර්ථ දක්වනු සාමාන්‍ය සිරිතයි."[7]

---

4. ජයදේව, උයන්ගොඩ., (2010). *සමාජීය-මානවීය විද්‍යා පර්යේෂණ - දාර්ශනික සහ ක්‍රමවේදී හැඳින්වීමක්.* කොළඹ. සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

5. ස.වි.ප.ක්‍ර., 2010, පි. 198

6. මි.ෆූ.වි.කෙ.හැ. 2021, පි. 334

7. පී.බී. මීගස්කුඹුර., (2020). *පෙරදිග මීමාංසා ශාස්ත්‍රය.* නූතන අර්ථ නිරූපණවේදය හා සෞන්දර්ය විචාරය. සම්මානිත මහාචාර්ය පී.බී. මීගස්කුඹුර ලේඛනාවලි, (සංස්.) *දඹුල්ලේ සුදේව සහ තවත් අය,* කළුබෝවිල, විදර්ශන ප්‍රකාශන, පි. 280.

මීගස්කුඹුරගේ යථෝක්ත ප්‍රකාශයෙන් ගම්‍ය වන්නේ ෆූකෝගේ විධික්‍රමයේ ආභාසයයි. ෆූකෝ පවසන නිශ්චිත අරමුණ සඳහා නිශ්චිත තලයක සිට භාෂාව මෙහෙයවීම පිළිබඳ අදහස මීගස්කුඹුර විසින් නිශ්චිත කථකයකු නිශ්චිත කතිකාවක් ලෙස අර්ථ ගන්වන බව පෙනේ. මේ අනුව ෆූකෝගේ විධික්‍රමය මානව ශාස්ත්‍ර අධ්‍යයනය කෙරෙහි භාවිත කිරීමට මීගස්කුඹුර වැනි විද්වතුන් උත්සාහ දරා තිබේ.

අධ්‍යයනයේ පරමාර්ථ

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වන්නේ එදිරිවීර සරච්චන්ද්‍ර ප්‍රමුඛ පේරාදෙණි ගුරුකුලය විසින් හඳුන්වා දී ව්‍යාප්ත කරමින් ස්ථාපිත කරන ලද සාහිත්‍ය විචාර කතිකාව හඳුනා ගනිමින් එම කතිකාව මගින් අවධානයට ලක් නොවූ සහ බැහැර කළ, නැතිනම් එතරම් අවධානයට ලක් නොකළ නවකථාකරුවන් හඳුනාගනිමින් එම බැහැර කිරීමේ ක්‍රියාවලිය විභාග කිරීම යි. සරච්චන්ද්‍ර ප්‍රමුඛ පේරාදෙණි ගුරුකුලය විසින් ස්ථාපිත කෙරුණු විචාර ක්‍රමය ලෙස මෙහි දී හඳුනා ගැනෙන්නේ 1943 'Modern Sinhala Fiction', 1950 'Sinhalese Novel' හා 1951 දී 'සිංහල නවකථා ඉතිහාසය හා විචාරය' යන නමින් පළ වූ ග්‍රන්ථය පදනම් කොටගෙන ආරම්භ වී පසු ව සරච්චන්චද්‍ර වික්‍රමසූරිය, ගුණදාස අමරසේකර, සිරි ගුනසිංහ, ආරිය රාජකරුණා, විමල් දිසානායක සුනන්ද මහේන්ද්‍ර වැනි පේරාදෙණි ගුරුකුලයේ පුරෝගාමීන් විසින් සංවර්ධනය කර ගොඩනංවන ලද විචාර මතවාද පද්ධතිය යි. එම විචාර මතවාද පද්ධතිය පෝෂණය කිරීම සඳහා සිරි ගුනසිංහගේ 'චිරන්තන සම්ප්‍රදාය හා ප්‍රගතිය'ඃ ගුණදාස අමරසේකරගේ 'විනෝදයයි විචාරයයි', ආරිය රාජකරුණාගේ 'විචාරාත්මක සිංහල සාහිත්‍ය ලිපි', 'සාහිත්‍ය රුචිය හා නවකථා විචාරය' 'සම්ප්‍රදාය සහ සිහින ලෝකය', විමල් දිසානායක ගේ 'නිර්මාණය හා විචාරය' (1970), 'ගිරිකුල හා සඳමඬල' සරච්චන්ද්‍ර වික්‍රමසූරියගේ 'සිංහල නවකථා විවරණය වැනි කෘති සමුදායක් දායකත්වය සැපයූ බව පෙනේ. මෙම කෘතිවල සමස්ත හරය වන්නේ අද්භූත ප්‍රබන්ධ කථාවලින් හා බොළඳ යැයි සම්මත ප්‍රේමකථාවලින් මිදී තාත්වික නැතහොත් යථාර්ථවාදී යැයි පිළිගැනෙන විධික්‍රමයක් සහිත ප්‍රබන්ධ කථා අගය කිරීමත් ඒවායේ පසුබිම පිළිබඳ විවිධ විදේශීය සාහිත්‍යධරයන්ගේ අදහස් හා නිදර්ශන ගෙන හැර පාමින් සිංහල පාඨකයන් අතර සංවාදයක් නිර්මාණය කිරීම යි. මෙම කතිකාව ආරම්භක යුගයේ දී මාර්ටින් වික්‍රමසිංහ පරමාදර්ශී යථාර්ථවාදී ලේඛකයා ලෙස හුවා දැක්වූ අතර, ඩබ්ලිව්. ඒ. සිල්වා සහ පියදාස සිරිසේන යන දෙදෙනා ප්‍රචාරාත්මක හා බොළඳ ලේඛකයන් ලෙස තදබල විචාරයට ලක් කළේ ය. ෆූකෝගේ අර්ථයෙන් කිවහොත් පේරාදෙණි විචාර කතිකාව මගින් මාර්ටින් වික්‍රමසිංහ යථාර්ථවාදී නවකතාකරුවා ලෙස පිළිගැනීමට ලක් කරමින් තම කතිකාව තුළට ඇතුළත් කර ගන්නා ලද අතර, ඩබ්ලිව්. ඒ. සිල්වා සහ පියදාස සිරිසේන එම කතිකාවෙන් බැහැර කර දමනු ලැබූහ. මෙම ලිපියේ දී සිදු කෙරෙන්නේ මෙසේ බැහැර කරන ලද තවත් ලේඛකයන් හඳුනාගැනීමත් බැහැර කිරීමේ ක්‍රියාවලියේ ස්වභාවය විමර්ශනයට ලක් කිරීමත් ය. එහි දී බැහැර කරන ලද ලේඛකයන් කවුරුන් ද යන්න හඳුනාගැනෙන අතර, බැහැර කිරීම සඳහා කතිකාව ගොඩනැංවූ ආකාරය පිළිබඳ කරුණු විශ්ලේෂණාත්මක ලෙස අවධානයට ලක් වේ.

පේරාදෙණි විචාර කතිකාව ගොඩනැගුණු පසුබිම

පේරාදෙණි විචාර කතිකාවේ මූලික අදහස එදිරිවීර සරච්චන්ද්‍ර විසින් 1943 සිට 1951 දක්වා ක්‍රමික ව වර්ධනය කළ බව පෙනේ. 1951 දී සරච්චන්ද්‍රගේ 'Modern Sinhalese Fiction' සිංහලට පරිවර්තනය වීමත් සමඟ ම සරච්චන්ද්‍රගේ විචාර න්‍යායයන් පුළුල් ලෙස සිංහල පාඨකයා අතර පැතිර ගිය බවත්, පේරාදෙණි සරසවියට පිවිසි ශිෂ්‍යයන් විසින් එය රට පුරා ව්‍යාප්ත කරන ලද බවත් නිරීක්ෂණය කළ හැකි ය. සේන තෝරදෙණිය පෙන්වා දෙන්නේ පේරාදෙණිය ගුරුකුලය සංස්ථාපනය වනවිට එම කෘතිය 1954, 1960, 1962, 1968 යන වර්ෂවල නැවත මුද්‍රණය වූ බවත්, එය සිංහල විෂයේ බයිබලය බවට පත්වූ බවත් ය.[8] සරච්චන්ද්‍රගේ මෙම කෘතියෙන් පසු ආරිය රාජකරුණා, ගුණදාස අමරසේකර, සරච්චන්ද්‍ර වික්‍රමසූරිය වැනි අයගේ කෘති හා ලිපිලේඛන විවිධාකාරයෙන් මුද්‍රණය වී රට පුරා ව්‍යාප්ත වූ බව පෙනේ. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ උපාධිධරයෙක් හා පසු ව එහි මහාචාර්යවරයෙකු වූ සුනන්ද මහේන්ද්‍ර මැල් මෙම කතිකාව තම ලිපිලේඛන මගින් පෝෂණය කළ ආකාරය පේරාදෙණියෙන් පළ කළ 'පියවර' සඟරාවට ඔහු රචනා කළ 'සිංහල නවකථාවේ සන්දර්භ ගවේෂණය හා හර පෙරළිය' යන ලිපිය සාක්ෂ්‍ය සපය යි.[9] (මේ නිසා මෙම ලිපිය ද සරච්චන්ද්‍ර විචාර පද්ධතිය ව්‍යාප්ත කරන පේරාදෙණි කතිකාවේ ප්‍රකාශනයක් ලෙස සැලකිය හැකි ය.) මෙම කතිකාව වඩාත් බලවත්ව නැඟී සිටියේ 1955-1975 දක්වා වූ විසි වසක කාල පරාසය තුළ ය. මෙම කාලසීමාව තුළ රචිත ප්‍රබන්ධ කථා අතර සරච්චන්ද්‍ර සහ ඔහුගේ අනුගාමිකයන් විසින් බැහැර කරන ලද ප්‍රබන්ධකරුවන් අතර අගය කළ හැකි අවධානයට ලක් කළ යුතු මූලික ප්‍රබන්ධකරුවන් කීපදෙනෙකු වන වැවදෙණියේ ඇල්. ඩී. මැන්දිස්, සෝමපාල රණතුංග, මායාරංජන් (1913-1968) සිරි තිලකසිරි වැනි ලේඛකයන් රචනා කරන ලද කෘති අපගේ අවධානයට ලක් වේ. නූතන සිංහල නවකථාව පිළිබඳ ප්‍රවාදය වඩාත් විධිමත් ලෙස ගොඩනැගූ සරච්චන්ද්‍ර ඒ වන විටත් මාර්ටින් වික්‍රමසිංහ නූතන සාහිත්‍යය සම්බන්ධයෙන් ගෙන යමින් පැවැති ක්‍රියාවලිය සඳහා විචාරාත්මක දායකත්වය ලබා දුන් අතර, සිංහල නවකථාවේ නිර්මාණාත්මක පාර්ශ්වය අගය කිරීම මෙම කතිකාවේ ප්‍රධානතම සාධකය විය. මෙම විසි වසර තුළ පේරාදෙණි ගුරුකුලයේ නැඟීමත්, නූතන සිංහල සාහිත්‍යයේ ප්‍රසාරණයත් සමාන්තර ව සිදුවිය. එම යුගයේ පැවැති විශේෂත්වයක් වන්නේ සිංහල නවකථාව, යථාර්ථවාදී ප්‍රවණතාවෙන් පමණක් නොව, නූතනවාදී ප්‍රවණතාවෙන් ද පෝෂණය වීම යි. මෙම යුගයේ නවකථා විමර්ශනය කිරීමේ දී නිරීක්ෂණය කළ හැක්කේ කථාන්දර කලාව වෙනුවට පුද්ගලයාත්, සමාජයත් සියුම් ලෙස නිරීක්ෂණය කරන කලා මාධ්‍යයක් වශයෙන් නවකථාවේ ශක්‍යතාව හඳුනාගැනීමත් එම ශක්‍යතාවයේ විවිධ රූපාකාර ගෙනහැර පෑමත් සිදුවූ බව යි. මේ යුගයේ පහළ වූ බොහෝ විචාරකයන් ද නවකථාකරුවන් වූ අතර, මාර්ටින් වික්‍රමසිංහ, ජී.බී. සේනානායක, එදිරිවීර සරච්චන්ද්‍ර, සිරි ගුනසිංහ, ගුණදාස අමරසේකර, හේමරත්න ලියනාරච්චි ආදීහු මේ ගණයට අයත් වෙති. නවකථාකරුවන් නොවී විචාරකයන් බවට පත් වූ අය වශයෙන් කැපී පෙනෙන්නේ ආරිය රාජකරුණා සහ සරච්චන්ද්‍ර වික්‍රමසූරිය යි.

---

8. සේන, තෝරදෙණිය., (2018). *පේරාදෙණිය ගුරුකුලයේ උපත.* නැඟීම හා බිඳවැටීම. කොළඹ. ෆාස්ට් පබ්ලිෂින්. පි. 164.

9. සුනන්ද, මහේන්ද්‍ර, මැල්., (1964). *සිංහල නවකතාවේ සන්දර්භ ගවේෂණය හා හර පෙරළිය.* පියවර සඟරාව. පේරාදෙණිය. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය. පි. 179-188.

පේරාදෙණි කතිකාවේ කැපී පෙනෙන ලක්ෂණ වන්නේ විශ්ව සාහිත්‍යයෙන් උදාහරණ උපයෝගී කොටගනිමින් සිංහල නවකථාව පමණක් නොව, වඩා දියුණු සිංහල පාඨකයකු හා විචාරකයකු ගොඩනැංවීමට උත්සාහ ගැනීම යි. එවකට සිංහල පාඨකයා අතර බෙහෙවින් ජනප්‍රිය ව තිබූ නවකථා ගුණයෙන් අඩු ප්‍රබන්ධ සාහිත්‍ය සමග ගැටෙමින් කලාත්මක නවකථාව ලෙස තමා විශ්වාස කළ නවකථා ස්වරූපය සිංහල සමාජයෙහි ව්‍යාප්ත කිරීම සඳහා ප්‍රබල උත්සාහයක නිරත වීම මෙම කතිකාවෙහි දක්නට ලැබුණු ප්‍රධාන ලක්ෂණයකි. නවකථාවේ ශිල්පී පාර්ශ්වය සහ එහි අර්ථය අතර ඇති සබඳතාව මෙහි දී අවධානයට ලක් වූ අතර, මාර්ටින් වික්‍රමසිංහ වඩාත් සාර්ථක හා පරමාදර්ශී නවකතාකරුවා ලෙස ප්‍රවාද ගත කෙරිණි. එහෙත්, යම් අවස්ථාවක දී මෙම පේරාදෙණි විචාර කතිකාවෙහි අභ්‍යන්තර න්‍යායික මතභේදයක් ගොඩනැගුණු අතර, පේරාදෙණි සාහිත්‍යයට එරෙහි ව එහි ප්‍රධාන පෙළේ සාමාජිකයකු වූ ගුණදාස අමරසේකර මතවාදී ව නැගී සිටීමත්, එම කතිකාව මගින් ම ඉතා ඉහළ තලයකට ඔසවා සිටි මාර්ටින් වික්‍රමසිංහ පේරාදෙණි කතිකා විවේචනය කිරීමත් සමග එම විචාර කතිකාවේ ඓතිහාසික මෙහෙවර යම් අර්බුදයකට ලක් වූ බව පෙනේ.[10]

තව ද පේරාදෙණි විශ්වවිද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා ලංකාවේ වෙනත් විශ්වවිද්‍යාලවල අධ්‍යයන කාර්යමණ්ඩලයට සම්බන්ධ වූ විශේෂයෙන් ම සාහිත්‍ය අධ්‍යයනයේ නිරත වූ අය පේරාදෙණි කතිකාව ඉදිරියට ගෙන ගිය බව පෙනේ. විද්‍යාලංකාර සරසවිය තුළ විමල් දිසානායක, විද්‍යෝදය සරසවිය තුළ තිස්ස කාරියවසම් යනාදීන් මේ සඳහා උදාහරණ ලෙස පෙන්වා දිය හැකි අතර, ඔවුන් ආයතනික වශයෙන් පේරාදෙණි විශ්වවිද්‍යාලයේ සේවය නොකළ ද කතිකාමය වශයෙන් පේරාදෙණි විචාර කතිකාව නියෝජනය කළ බව පෙන්වා දිය හැකි ය. මේ අනුව පේරාදෙණි කතිකාව ව්‍යාප්ත වූයේ එම සරසවිය තුළ ම පමණක් නොව නිශ්චිත සංවාද භාෂාවක් හා බල ව්‍යූහයක් ලෙස රට තුළ ය. විශ්වවිද්‍යාල පද්ධතියෙන් බැහැර ව මෙම කතිකාව දියත් වූ ආකාරය මරදානේ රත්න පොත් ප්‍රකාශයන් විසින් පළ කළ රත්න සාහිත්‍ය විචාර ග්‍රන්ථ මාලා සඟරාව නිදසුන් ලෙස පෙන්වා දිය හැකි ය. නන්දසේන රත්නපාල වැනි පේරාදෙණි කතිකාවේ සක්‍රීය බුද්ධිමතුන් රත්න සාහිත්‍ය කතිකාව නියෝජනය කළ අතර, මෙහි මූලික පරමාර්ථය වූයේ විවිධ විභාග සඳහා නිර්දේශිත නූතන සාහිත්‍ය කෘතීන් විවරණයට ලක් කරමින් විද්‍යාර්ථීන් සඳහා අධ්‍යාපනික මෙවලම් නිර්මාණය කර දීමයි. එහෙත්, එය පේරාදෙණි විචාර පද්ධතිය ම තවත් අදියරකට ව්‍යාප්ත කළ අවස්ථාවක් ලෙස හඳුන්වාදිය හැකි ය. පේරාදෙණි කතිකාවේ මූලික න්‍යායාත්මක ප්‍රකාශනය හෙවත් මැනිෆෙස්ටෝව ලෙස හඳුනාගත හැක්කේ එදිරිවීර සරච්චන්ද්‍රගේ 'සිංහල නවකථා ඉතිහාසය හා විචාරය' කෘතිය යි. මැනිපෙස්ටෝවක් යනු කුමක් ද යන්න අර්ථ දක්වන බ්‍රිටනිකා විශ්වකෝෂය පවසන්නේ "මැනිපෙස්ටෝවක් මගින් සිදු කරන්නේ දැක්මවල්, මතවාද හා අදහස් මාලාවක් ඉදිරිපත් කිරීම බවයි. එනමුත් එය විසින් යම් ක්‍රියාකාරීත්වයක් සඳහා සැලසුමක් ද ඉදිරිපත් කෙරෙන බවත්, පවතින තත්ත්වයන් විවේචනය කරමින් නව ව්‍යාපෘතියක් ගොඩනගමින් නව යුගයක් සඳහා දායකත්වය ලබා දෙන බවත් එහි දී කියැවේ." යථෝක්ත අර්ථකථනයෙන් පෙනී යන්නේ මැනිපෙස්ටෝවක මූලික ගුණාංගය වන්නේ යම් විෂයයක් හෝ තත්ත්වයක් අරබයා එහි ගුණාංග විවේචනය කරමින් නව මතවාදයක් හා වැඩපිළිවෙළක් ඉදිරිපත් කිරීම යි.

[10]. මෙම ඓතිහාසික අර්බුදය මෙම ලිපියේ දී විශේෂ අවධානයට ලක් නොවේ. එය සඳහන් කරන්නේ හුදෙක් මෙම කතිකාවේ ඓතිහාසික විකාශනයේ එක් අදියරක් පෙන්වා දීමක් වශයෙන් පමණි.

සරච්චන්ද්‍රගේ 'සිංහල නවකථා ඉතිහාසය හා විචාරය' කෘතිය මේ අනුව පූර්ණ වශයෙන් මැනිපෙස්ටෝවක ලක්ෂණ පෙන්නුම් නොකරයි. එය මුලින් ම රචනා කළ 1943 දී පේරාදෙණි සරසවිය පිළිබඳ අදහසක් නොතිබුණු බව පෙනේ. එහෙත්, එහි සිංහල පරිවර්තනය නිකුත් වන 1951 වන විට නූතන සිංහල සාහිත්‍යය පිළිබඳ අදාළ වන සමාජ දේශපාලනික හා සංස්කෘතික සන්දර්භවල සැලකිය යුතු සංවර්ධනයක් සිදුවෙමින් පැවතුණි. එම සංවර්ධනය විසින් නූතන සිංහල සාහිත්‍ය ප්‍රබන්ධ අරබයා මැනිපෙස්ටෝවක් ඉල්ලා සිටි අතර, ශිෂ්‍ය ප්‍රජාව වර්ධනය වීමත් 1959 දී සිංහල භාෂාවෙන් ම කටයුතු කරන විශ්වවිද්‍යාල දෙකක් බිහිවීමත් සමඟ සිංහල සාහිත්‍ය විචාරය සම්බන්ධයෙන් මැනිපෙස්ටෝවක අවශ්‍යතාව ද පැන නැගුණි. මෙම සන්දර්භය තුළ සරච්චන්ද්‍රගේ කෘතිය මැනිපෙස්ටෝවක් ලෙස සලකමින් එය වටා පරිවාර කෘති රැසක් බිහිවූ බව නිරීක්ෂණය කළ හැකි ය. 1924 දී මාර්ටින් වික්‍රමසිංහ සිංහල කෙටිකථාව පිළිබඳ ව පුළුල් හැඳින්වීමක් සැපයීමත්, 1947 දී ජී.බී. සේනානායක තම 'නවකථා කලාව' කෘතිය මගින් නූතන හා සම්භාව්‍ය සාහිත්‍ය අතර පවතින සම්බන්ධය සූක්ෂ්ම ආකාරයෙන් විවරණය කිරීමත් සිදු කළ නමුත් සරච්චන්ද්‍ර සතු වූ ආයතනික බලය හා පුරෝගාමීත්වය ඔවුන් සතු නොවීය. මේ අනුව නූතන සිංහල සාහිත්‍යය සම්බන්ධයෙන් මැනිපෙස්ටෝවක අවශ්‍යතාව මතුවීම එම යුගයේ නෛසර්ගික අවශ්‍යතාවක් විය. සරච්චන්ද්‍රගේ මෙම මැනිපෙස්ටෝව පළ වීමත් සමඟ එයට සහයෝගීතාව ලබා දෙන කෘති සහ එම කතිකාව සංවර්ධනය කරන කෘති මාලාවක් පළ වූ අතර එය 1980 දශකයේ මැද භාගය දක්වා ම සිදුවූ බව පෙනේ. (නිදසුනක් ලෙස සිරි ගුනසිංහගේ 'චිරන්තන සම්ප්‍රදාය සහ ප්‍රගතිය' ලිපි මාලාව පළ වන්නේ 1985 දී ය.) එ මෙන් ම පේරාදෙණි විශ්වවිද්‍යාලයෙන් පළ කළ 'පියවර' හා 'නව පියවර' සඟරා සහ එම යුගයේ පළ වූ විවිධ සඟරා රාශියකින් (උදා: වීමංසා සඟරාව) පේරාදෙණි කතිකාව නොයෙක් ආකාරයෙන් පෝෂණය වූ බව පෙනේ. පසුකාලීන ව පේරාදෙණි ගුරුකුලය පිළිබඳ සංකල්පය විමර්ශනය කළ පී.බී. මීගස්කුඹුර පෙන්වා දෙන්නේ 50 හා 60 දශකවල පේරාදෙණියෙහි ඇති කළ කතිකාවෙහි විශේෂත්වය වන්නේ හුදෙක් විනෝදාස්වාදයට කැපවූ සාමාන්‍ය සාහිත්‍යයට වඩා වෙනස් යථාර්ථවාදී හා විදග්ධ සාහිත්‍යයක් පේරාදෙණියෙන් බිහිකළ බවයි. එසේ ම මෙම කතිකාවට විරුද්ධ විචාරකයන් විසින් පේරාදෙණි ගුරුකුලය, පේරාදෙණි කල්ලිය, පේරාදෙණි නඩය වැනි නාමයන්ගෙන් පේරාදෙණි කතිකාව හැඳින්වූ බව පෙනේ. තව ද මෙම කණ්ඩායමේ ප්‍රධාන භූමිකා වන එදිරිවීර සරච්චන්ද්‍ර, සිරි ගුනසිංහ, ගුණදාස අමරසේකර යන තිදෙනා අතර සාහිත්‍යයේ විවිධ පාර්ශ්ව අරබයා වෙනස් මතවාද පැවතිය ද ඒත් සියලු වෙනස්කම් මැද යම් පොදුභාවයකින් ද ක්‍රියා කළ බව නිරීක්ෂණය කළ හැකි ය. මේ අනුව සරච්චන්ද්‍ර ප්‍රමුඛ පේරාදෙණි විචාර කතිකාව නූතන සිංහල සාහිත්‍යය හා විචාරය කෙරෙහි ප්‍රබල බලපෑමක් එල්ල කළ කතිකාවක් ලෙස පෙන්වා දිය හැකි ය. විද්‍යාලංකාර සරසවිය තුළ ඒ. එම්. ජී. සිරිමාන්න වැනි ශාස්ත්‍රඥයින් මෙම කතිකාව වඩාත් සංවර්ධනාත්මකව ඉදිරියට ගෙන ගිය අතර, වංශනාථ දේශබන්ධු, සිරිමාන්නව හඳුන්වා ඇත්තේ "සරච්චන්ද්‍රව පලවා හැර කල්ලියේ නායකකම තමා අතට ගැනීමට තැත් කරන සරච්චන්ද්‍රටත් වඩා සරච්චන්ද්‍රමය වූ අයකු ලෙසයි."

සරච්චන්ද්‍ර ගොඩනැගූ විචාර නිර්ණායක

'සිංහල නවකථා ඉතිහාසය හා විචාරය' කෘතියේ දී එක් අතකින් සිංහල ප්‍රබන්ධයේ ඉතිහාසය ගෙනහැර පාන අතර ම නූතන සිංහල සාහිත්‍ය විනිශ්චය කිරීම සඳහා විචාර නිර්ණායක ගොඩනැගීමත්, ඒවා ප්‍රයෝගික විචාරයෙහි ලා ආදේශ කිරීමත් සිදු කෙරේ. අතීතයේ දී පැවති දේශීය රුචිකත්වය වෙනුවට වර්තමානයේ විශ්ව සාධාරණ රුචිකත්වයක් ගොඩනැගීම තම නිර්ණායකවල දී ඉදිරිපත් කිරීම සරච්චන්ද්‍ර සිදු කළේ ය.[11] එම විශ්ව සාධාරණ රුචිකත්ව නිර්ණායක තම අවධානයට ලක් වූ කෘතීන් විනිශ්චය කිරීම සඳහා සියුම් ලෙස ආදේශ කිරීම සරච්චන්ද්‍රගේ කෘතියෙහි දක්නට ලැබේ. අලුත්ගමගේ සයිමන් ද සිල්වා ගැන ලියමින් ඔහු මෙසේ පවසයිඃ

> "සමකාලීන ව ලියූ පියදාස සිරිසේන මහතාට තරම් කීර්තියක් ඔහුට අත් නොවූයේ නවකතා රසය අවබෝධ කළ පාඨක සමූහයක් එකල නොවූ හෙයිනැයි සිතීමට ඉඩ තිබේ."[12]

පියදාස සිරිසේනගේ 'ජයතිස්ස හා රොසලින්' (1906) විවේචනය කරමින් ඔහු මෙසේ පවසයිඃ

> "කථා වස්තුවෙහි අභ්‍යව්‍ය ගතිය නිසා චරිතයනට ද අභව්‍ය ස්වරූපයක් ආරූඪ වී තිබෙනු පමණක් නොව, සාමාන්‍යයෙන් පියදාස සිරිසේන මහතාගේ චරිත නිරූපණයෙහි ද කිසිදු ගැඹුරක් නොවන බව ද කිව යුතු ව තිබේ."[13]

ඩබ්ලිව්. ඒ. සිල්වා නම් පරිච්ඡේදයේ දී ඔහු මෙසේ පවසයිඃ

> "චරිත නිර්මාණය අතින් සිල්වා මහතා කොපමණ දුර්වල ද කියා මේ නවකථාවෙන් මැනවින් හෙළි වේ."[14]

මාර්ටින් වික්‍රමසිංහ පිළිබඳ පරිච්ඡේදයේ දී පවසන අදහස් කීපයක් මෙසේ යඃ

> "ගම්පෙරළිය වනාහි ගැමි ජීවිතය ආශ්‍රය කොට ලියන ලද ඉතා අගනා සිංහල නවකථාව ය. බටහිර සාහිත්‍යයෙන් අප සාහිත්‍යයට ඇතුළු වූ නවකථා කලාව දේශීය සම්ප්‍රදායක් අනුව හැඩගැස්විය හැකි ආකාරය මේ කෘතියෙන් මනාව වැටහේ."[15]

සරච්චන්ද්‍ර ගේ කෘතියෙහි අවසානයෙහි ඇතුළත් කොට තිබෙන වෙනත් නවකථා ස්වල්පයක් නම් කුඩා පරිච්ඡේදය ද නූතන සිංහල ගද්‍ය ඇගයීමෙහි ලා ඔහු පළ කළ විචාර නිර්ණායක හඳුනාගැනීම සඳහා වැදගත් ය. එහි දී ඔහු වී. ඩී. ද ලැනරෝල්ගේ 'අතීතය' (1943) හා 'පාසල් සමය' (1947) "මෑත ලියන ලද නවකථා අතර සැලකිය යුතු කෘති දෙකක් ලෙස නම් කරයි."[16]

JOURNAL OF THE FACULTY OF HUMANITIES -30

11. එදිරිවීර, සරච්චන්ද්‍ර., (2003). *සිංහල නවකථා ඉතිහාසය හා විචාරය.* නුගේගොඩ. සරසවිය ප්‍රකාශකයෝ. පි. 7.
12.- එම - පි. 58.
13.- එම - පි. 81.
14.- එම - පි. 99
15.- එම - පි. 118.
16.- එම - පි. 159.

ටී. බී. ඉලංගරත්නගේ විලම්භීත' (1953) 'තිලක', 'අඹයහළුවෝ' (1957) නවකථා ගැන ඔහු පවසන්නේ "විෂය වශයෙන් හෝ සන්දර්භය වශයෙන් හෝ මෙකල පාඨකයාගේ ගැඹුරු රසවින්දනයකට තරම් වන බවක් නොපෙනේ."[17] යනුවෙනි. මෙම පරිච්ඡේදයේ දී ඔහුගේ සාධනීය ඇගයීමට ලක් වන්නේ ගුණදාස අමරසේකර ගේ 'කරුමක්කාරයෝ' (1955) නවකථාව යි. සරච්චන්ද්‍ර තම කෘතිය 1951. 1954, 1960, 1962, 1964, 1968 යන වසරවල මුද්‍රණය කර ඇති අතර, 1996 ඔහුගේ මරණයෙන් පසු ද මෙම කෘතිය දිගින් දිගට ම මුද්‍රණය වෙමින් පවතී. එහෙත්, තම ජීවිත කාලය තුළ දිගු කාලයක් කෘතිය මුද්‍රණය වුව ද සුළු භාෂාමය සංශෝධන හැර සැලකිය යුතු සංශෝධනයක් සිදුවී තිබෙන්නේ තුන්වන මුද්‍රණයේ දී පමණක් බව පෙන්වා දිය හැකි ය. එහි දී 'අද්‍යතන නවකථාකරුවා ගත් මග' නම් අවසාන පරිච්ඡේදය අරඹමින් කතුවරයා මෙසේ කිය යිඃ

> "1960 දී මේ පොතේ තුන්වන සංස්කරණයක් පිට වූ පසු සැලකිය යුතු නවකථා කීපයක් පළ වීම පමණක් නොව, විෂය අතින් සිංහල නවකථාවේ වැදගත් වෙනස් වීම් ද සිදුවී තිබෙන බව කිව මනා ය."[18]

මෙම නව සංස්කරණයේ දී සැලකිය යුතු නවකථා ලෙස සාධනීය අගය කිරීමකට ලක් කරන්නේ 'යළි උපන්නෙමි' (1960), 'හෙවණැල්ල', 'සිත නැති බඹ ලොව', 'චරිත තුනක්' (1963), 'පරාජිතයෝ' (1960), 'හෙවණැලි ඇද මිනිස්සු', 'අන්තිම දා' (1967) යනාදී කෘතීන් ය. මේ වන විට බිහි වී තිබූ සිරි තිලකසිරිගේ 'නොනිදා දුටු සිහින', වැවදෙණියේ ඇල්. ඩී. මැන්දිස්ගේ 'හිච්චි බබා' (1962), 'දිනපාලගේ කතාන්දරය' (1962), 'උපාධිය' (1966), මායාරංජන්ගේ 'කුමාරයා හා රන්මැණිකා' (1969), සෝමපාල රණතුංගගේ 'ඇස්දෙක' වැනි කිසිදු කෘතියක් සරච්චන්ද්‍රගේ කෘතියෙහි සඳහන් නොවේ.

එසේ ම අප මෙම ලිපියේ මුලින් සාකච්ඡා කළ සරච්චන්ද්‍ර කතිකාව / පේරාදෙණි කතිකාව නියෝජනය කළ කිසිදු විචාරකයකු ඉහත නම් සඳහන් කළ කතුවරුන් ගේ කෘති පිළිබඳ සාකච්ඡා කොට නොමැත.

මෙයින් පෙනී යන්නේ මිචෙල් ෆූකෝ පෙන්වා දුන් ආකාරයට පේරාදෙණි කතිකාව විසින් නිශ්චිත සංවාද භාෂාවක් තුළ නිශ්චිත පිරිසක් තම කතිකාව තුළට ඇතුළත් කොටගෙන ඇති අතර, තව පිරිසක් බැහැර කොට ඇති බවයි.

5. නිගමනය

මෙම ලිපියේ දී අපගේ අවධානයට යොමු වූයේ එදිරිවීර සරච්චන්ද්‍ර ප්‍රමුඛ පේරාදෙණි කතිකාව මගින් ගොඩනැගූ නූතන සිංහල සාහිත්‍ය විචාරය සම්බන්ධ විචාර කතිකාව හඳුනාගැනීමත් එම කතිකාව ඓතිහාසික ව විකාශනය වූ ආකාරය පෙන්වා දීමත් එම කතිකාවෙන් බැහැර කරන ලද කතුවරුන් සහ නිර්මාණ පිළිබඳ ව හඳුනාගැනීමත් ය. මේ අනුව පෙන්වා දිය හැක්කේ පේරාදෙණි විචාර කතිකාව මගින් යම් නිශ්චිත නවකථාකරුවන් පිරිසක් ඇගයීමට ලක් කළ අතර, යම් නිශ්චිත නවකථාකරුවන් පිරිසක් බැහැර කිරීමට ලක් කළ බව ය.

17. - එම - පි. 160.

18. - එම - පි. 179.

JOURNAL OF THE FACULTY OF HUMANITIES -30

පියදාස සිරිසේන, ඩබ්ලිව්.ඒ. සිල්වා වැනි කතුවරුන්ගේ කෘති පේරාදෙණි විචාර නිර්ණායක මගින් බැහැර කිරීමට හේතු දක්වා ඇතත්, අප මෙහි සාකච්ඡා කළ කතුවරුන්ගේ නිර්මාණ බැහැර කිරීමේ හේතු පැහැදිලි ව සඳහන් කොට නොමැත. එනිසා මෙම බැහැර කිරීම් පිළිබඳ නිශ්චිත ව හේතු සාධක විමර්ශනය කිරීම අපහසු ය. නිගමනයකට පැමිණිය හැක්කේ යම් තෝරා ගත් ලේඛකයන් පිරිසක් ඇතුළත් කොට ඇති බවත්, යම් තෝරා ගත් ලේඛකයන් පිරිසක් බැහැර කොට ඇති බවත් ය. ලැනරෝල් සම්බන්ධයෙන් සරච්චන්ද්‍ර එක් වැකියකින් අගය කිරීමක් සිදු කළත්, එම ප්‍රවාදය වර්ධනය කරන්නේ නැත. ඉලංගරත්න ගේ කෘති වැකි කිහිපයකින් විවේචනය කළත් එයට හේතු සාධක පෙන්වා දෙන්නේ නැත. අප මෙහි සඳහන් කළ සෙසු ලේඛකයන් පිළිබඳ කිසිදු සඳහනක් සිදු කරන්නේ නැත. එය සරච්චන්ද්‍රට පමණක් නොව, ඔහුගේ කතිකාව නියෝජනය කළ සියලුම ලේඛකයන් සතු පොදු තත්ත්වයකි.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 30

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

උයන්ගොඩ, ජයදේව., (2010). *සමාජීය-මානවීය විද්‍යා පර්යේෂණ - දාර්ශනික සහ ක්‍රමවේදී හැඳින්වීමක්.* කොළඹ. සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

තෝරදෙණිය, සේන., (2018). *පේරාදෙණිය ගුරුකුලයේ උපත. නැගීම හා බිඳවැටීම.* කොළඹ. ෆාස්ට් පබ්ලිෂින්.

ද සිල්වා, මුල්ලපිටියේ කේ.එච්., (1966). *සිංහල නවකතාවේ පුරෝගාමියා.* කොළඹ. ශ්‍රී ලංකා ප්‍රකාශක සමාගම.

මල්ලිකාරච්චි, ඩෙස්මන්., (2003). *සමාජ හා මානව විද්‍යාත්මක ලිපි.* කර්තෘ ප්‍රකාශන. පි. 20 හා 38. ජයදේව, උයන්ගොඩ., (2021). මිචෙල් ෆූකෝගේ විධික්‍රමය කෙටි හැඳින්වීමක්, *ලංකාවේ නව ප්‍රතිජාතික චින්තනයේ දසවසක්.* (සංස්.) නිර්මාල් රංජිත් දේවසිරි, දෙවන වෙළුම (1992-1997), කළුබෝවිල. විදර්ශන ප්‍රකාශන,

මැද්දේගම, උදය ප්‍රශාන්ත., (1999). *සියවසක සිංහල නවකතා.* කොළඹ. ඇස්. ගොඩගේ.

මැල්, සුනන්ද මහේන්ද්‍ර., (1964). *සිංහල නවකතාවේ සන්දර්භ ගවේෂණය හා හර පෙරළිය.* පියවර සඟරාව. පේරාදෙණිය. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලය.

මීගස්කුඹුර, පී.බී., (2020). *පෙරදිග මීමාංසා ශාස්ත්‍රය. නූතන අර්ථ නිරූපණවේදය හා සෞන්දර්ය විචාරය.* සම්මානිත මහාචාර්ය පී.බී. මීගස්කුඹුර ලේඛනාවලි, (සංස්.) දඹුල්ලේ සුදේව සහ තවත් අය, කළුබෝවිල. විදර්ශන ප්‍රකාශන.

රාජකරුණා, ආරිය., (2003). *සිංහල නවකතාවේ ආරම්භය.* කොළඹ. ඇස්. ගොඩගේ.

රාජකරුණා, ආරිය., (1994). *19 වන සියවසේ සිංහල ගද්‍ය සාහිත්‍ය.* කොළඹ. ප්‍රදීප ප්‍රකාශකයෝ.

සරච්චන්ද්‍ර, එදිරිවීර., (2011). *සිංහල නවකතා ඉතිහාසය හා විචාරය.* නුගේගොඩ. සරසවි ප්‍රකාශකයෝ.

වැන්දබෝනා, තොම්සන්, ඒ., (1997). *සිංහල නවකතාවේ ආදිතමයෝ.* කොළඹ. සූරිය ප්‍රකාශකයෝ.

වික්‍රමසූරිය, සරච්චන්ද්‍ර., (1970). *සිංහල නවකතාවට මගපෑදීම.* මහනුවර. සරසවි මුද්‍රණාලය.

References

Devi, Vasudev, Gayatri, (2009). *Vāstu*. Motilal Banarshidass Publishers. Delhi.

Williams, Monior, (2005). *Sanskrit - English Dictionary.* Asian Educational Services. New Delhi.

Sarathchandra, E.R., (1950). *Modern Sinhalese Fiction*. Colombo. M.D.Gunaseana.

The Sinhalese Novel, (1950). Colombo. M.D. Gunaseana.

Uyangoda, Jayadewa., (2017). *Social Research Philsophical and Methodological Foundations.* Social Scienties Association - Colombo.

JOURNAL OF THE FACULTY OF HUMANITIES 30